REFERENCE
NOT TO BE
REMOVED
FROM THE
LIBRARY

# ද්විතියික විෂයමාලාවේ තෝරාගත් දැනීම් ශික්ෂණවලට විශේෂ අවධානය යොමු කරමින්, දැනීම් න්‍යාය සහ විෂයමාලාව පිළිබඳ විමර්ශනයක්.

වැල්ලහේවාගේ ජෝර්ජ් ඇල්ප්‍රෙඩ් ද සිල්වා ( M.Phil. I08)

පුහුණු 1 පෙළ.

බී.ඒ. (විද්‍යෝදය)

අධ්‍යාපන ඩිප්ලෝමා (ශ්‍රී ලංකා)

අධ්‍යාපනපති ( කොළඹ )

කොළඹ විශ්ව විද්‍යාලයයේ අධ්‍යාපන පීඨය මගින්

1981 පැවැත්වූ දර්ශනපති පරීක්ෂණයේ

අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම

සඳහා සැකසුන

නිබන්ධනයකි.

අධ්‍යාපන පීඨය.

කොළඹ විශ්ව විද්‍යාලය.

1981 සැප්තැම්බර්.

UNIVERSITY OF COLOMBO LIBRARY

UCLIB
380601

## නිබන්ධනයේ සාරාංශය.


දැනීම් න්‍යාය සහ විෂයමාලාව පිළිබඳව දාර්ශනික දෘෂ්ටි කෝනයෙන් විභාග කිරීමත්, ඒ ආශ්‍රිත වන මනෝ විද්‍යාත්මක, සමාජ විද්‍යාත්මක හා මානව විද්‍යාත්මක කරුණු තුලනාත්මකව සලකා බැලීමත් ප්‍රථමයෙන් කර තිබේ. දැනීම යනු කුමක්ද? විශ්වාස යනු කුමක්ද? එක් එක් දාර්ශනිකයා ඒවාට දැක්වූ අර්ථ නිරූපන සහ ඒවායේ ප්‍රබලතා, දුබලතා, විමසා ඇත. පර්යේෂණයේ අරමුණු හා බැඳෙන උපන්‍යාස (ප්‍රස්තුත) තෝරා ඒවා විමර්ශනය කර ඇත.

පසුව හින්දු, බෞද්ධ, ග්‍රීක් සහ නූතන බටහිර දාර්ශනිකය න්ගේ දැනීම් න්‍යාය පිළිබඳ මත විශ්ලේෂණයක් මෙයට ඇතුළත්ය. එමෙන්ම අවස්ථාවෝචිත පරිදි ඒ තුළින් සමුච්චිත වාදයක් ගොඩනැඟීමේ ප්‍රයත්නයක් දරා ඇත.

මීළඟට විෂයමාලා සම්පාදකයන්ට උපකාරී විය හැකි දැනීම් න්‍යායේ එන දැනීම ලබන ක්‍රම විභාජනය කරන ලදී. (අපදේශය, ශ්‍රැතිය, ප්‍රතිභාව, අනුභූතිය, තර්කනය, විද්‍යාත්මක ක්‍රමය, ගවේෂණය, ආර්ශනික විග්‍රහය) පර්යේෂයනට ආධාරයක් වශයෙන් විෂයමාලාව පිළිබඳ මතාන්තර විමර්ශනය කර ඇති අතර, දැනීම් න්‍යාය ආශ්‍රිත විෂයමාලා ආකෘතියක් ගොඩ නැංවීමට ප්‍රයත්නයක් දරා ඇත.

එහිදී, පිලිප් ෆිනික්ස්, පී.එච්.හර්ස්ට්, රේමන්ඩ් විලියම්ස් ජෝස්ප් ස්ක්වැබ්, ආදීන්ගේ දැනීම් ශික්ෂණ වර්ගීකරන විභාග කරන ලද අතර, බී.එස්.බ්ලූම් ගේ අධ්‍යාපන අරමුණු විග්‍රහයද දැනීම් න්‍යාය ආශ්‍රයෙන් විග්‍රහ කිරීමට වෑයම් කරන ලදී.

එමෙන්ම ඩී.කේ.වීලර්, ඩෙනිස් ලෝටන්, එලිසබෙත් මැකියා ජෝන් එෆ්ක්කර් ආදීන්ගේ විෂයමාලා ආකෘති විභාග කර ඇති අතර, පර්යේෂණය මඟින් ගොඩ නැංවූ සංකල්පයට අනුකූල විෂයමාලා ආකෘතියක් ගොඩ නඟා තිබේ.

ඒ ඇසුරෙන් ද්විතියික විෂයමාලාවේ, භාෂාව, විද්‍යාව, සහ සමාජ අධ්‍යයන යන දැනීම් ශික්ෂණ විභාග කරන ලද අතර පර්යේෂණය තුලින් මතුවූ අදහස් සහ වැඩිදුර සංවර්ධනයට උචිත යෝජනා ඉදිරිපත් කර තිබේ.